ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## පොසොන් මංගල්‍යයට සමගාමීව පැවති ඉන්දියාවේ බෞද්ධ උරුමය පිළිබඳ ප්‍රදර්ශනය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහස්‍ර වර්ෂ ගණනාවක් පැරණි බොදු සබඳතාවය පිළිඹිබු කරයි

කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය 2023 ජූනි 3-4 දිනවල හෝමාගම පොසොන් කලාපය තුළ ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය පිළිබඳ විශේෂ ප්‍රදර්ශනයක් සංවිධානය කර තිබිණ. මෙම ප්‍රදර්ශනය ප්‍රවාහන සහ මහා මාර්ග සහ ජන මාධ්‍ය අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා විසින් විවෘත කෙරුණු අතර එම අවස්ථාව සඳහා රාජ්‍ය තාන්ත්‍රිකයන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී වූහ.

2. උත්තර් ප්‍රදේශ් හි ධමෙක් ස්තූපය, බිහාරයේ මහාබෝධි විහාරය සහ අශෝක කුළුණ සහ මධ්‍ය ප්‍රදේශ් හි සාංචි ස්තූපය ඇතුළු ඉන්දියාවේ වැදගත් බෞද්ධ සිද්ධස්ථාන දැක්වෙන ඡායාරූප මෙම ප්‍රදර්ශනයට ඇතුළත් කර තිබිණ. සියවස් ගණනාවක් පැරණි මූර්ති සහ කැටයම්වල ඡායාරූප ද මෙහි දී ප්‍රදර්ශනය කෙරිණ.

3. මෙම ප්‍රදර්ශනයේ පැවති තවත් විශේෂත්වයක් වූයේ එක් පැත්තක මහින්දාගමනය දැක්වෙන විශේෂ පහන් කූඩුව යි. මෙම පහන් කූඩුවේ අනෙක් පැතිවල බුදු දහමේ සතර බ්‍රහ්ම විහරණ වන මෙත්තා, කරුණා, මුදිතා සහ උපේක්ඛා සහ ඉන්දියාවේ G20 සභාපතිත්වයේ තේමාව වන එක් පෘථිවියක්, එක් පවුලක්, එක් අනාගතයක් යන්න අතර තිබෙන ශක්තිමත් සබඳතාවය ද නිරූපණය කර තිබිණ.

4. මිහිඳු මහ රහතන් වහන්සේ ඉන්දියාවේ සිට බුදු දහම රැගෙන ශ්‍රී ලංකාවට වැඩම කළ පොසොන් පොහොය දිනය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඉපැරණි සබඳතා සිහිපත් කරයි. මෙම ශිෂ්ටාචාරමය බැඳීම තවදුරටත් වර්ධනය කිරීම උදෙසා අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා බොදු සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 15ක විශේෂ ප්‍රදානයක් නිවේදනය කර ඇත. මෙම ප්‍රදානය යටතේ ශ්‍රී ලංකාව පුරා විහාරස්ථාන සිය ගණනක් සූර්ය විදුලියෙන් බල ගැන්වීම සඳහා පියවර ගනිමින් පවතී. පසුගිය මාසයේ දී උතුම් වෙසක් මංගල්‍යයට සමගාමීව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය කොළඹ, ගංගාරාම සීමාමාලකයේ දී විශේෂ ප්‍රදර්ශනයක් ද සංවිධානය කර තිබිණ.

***

කොළඹ
2023 ජූනි 4